# මාදන්වල රජමහා විහාරයෙහි ඓතිහාසික ගවේෂණය

ඒ. එම්. ලෝෂිනී සෞම්‍යා අත්තනායක*

ඓතිහාසික වශයෙන් වැදගත් වන ස්ථානයක් වශයෙන්, මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 493 දරන කොස්රුප්ප ග්‍රාමසේවා වසමේ පිහිටි මාදන්වල රජමහා විහාරය හඳුනාගත හැකිය. මෙම මාදන්වල විහාරයේ නිර්මාතෘ වළගම්බා රජු බව ජනප්‍රවාදයෙහි සඳහන් වේ. මෙම විහාරස්ථානය දෙවන රාජසිංහ රාජ්‍ය සමයෙහි ද පැවති බවට සාධක 1635 වර්ෂයට අයත් දමුණුමැය සන්නස සාක්ෂි සපයයි. මෙහි ඉතිහාසය පිළිබඳ මුල්ම ලේඛන දෙවන රාජසිංහ රාජ්‍ය සමයෙහි හා ඉන් පසුව රචනා වූ ඒවා වුවද, මෙම විහාරය සතුව පවතින කලාත්මක අතින් අතිශය අනර්ඝ ස්වර්ණාලිප්ත ලෝකඩ බුද්ධ ප්‍රතිමා වහන්සේ ගම්පොළ සමයට අයත් වේ යැයි ලිඛිත මූලාශ්‍ර වල සඳහන් වේ. දෙවන රාජසිංහය රජුගේත් දෙවන විමලධර්මසූරිය රජුගෙත් නොමඳ අනුග්‍රහයට මෙම විහාරස්ථානය පාත්‍ර වී ඇත. එම රජු විසින් විහාරස්ථානයෙහි වූ ස්වර්ණාලිප්ත බුද්ධ ප්‍රතිමාවට දිවා දානය ගෙනඒම සිරිතක් ලෙස තිබී ඇති අතර මේ සඳහා යොදාගත් ලෝහමය පාත්‍ර ද්විත්වයක් දනුදු විහාරය සතුව ඇත. ඒවායේ ගැටිවල "වාහල" යන්න කොටා ඇති බව දකගත හැකිය. විහාරස්ථාන භූමියේ දනට ඉතිරිව ඇති පැරණි ගොඩනැගිලි ලෙස දකගත හැක්කේ අනුරාධපුර අවධියෙහි කටාරම් කොටා සැකසූ බැව් සිතිය හැකි ලෙනෙහි වූ මහනුවර අවධියට අයත් විහාරගෙයි සිවිලිම් බදාම පදාසයකුත්, ඓතිහාසික බෝධි වෘක්ෂයත්, ආවාස ගෘහයත් පමණි. මහනුවර යුගයට අයත් වූ යැයි සැලකෙන ධර්මශාලාව දනට පවතින  පිරිවෙන් ගොඩනැගිල්ල තනනු පිණිස, මීට දශක තුනකට පමණ පෙර ඉවත්කර ඇත. ලෙන්විහාර ගෘහය තුළ 19 වන සියවස මුල් භාගයේ තනනු ලැබුවායි සැලකෙන සිතුවමින් සැරසුණු  සිවිලිම් ලැලි කිහිපයක් මේ තාක් සුරක්ෂිත කිරීමට පියවර ගෙන තිබේ. ස්වර්ණාලිප්ත බුද්ධ ප්‍රතිමාව  තැන්පත් කර ඇත්තේ තත් සඳහන් වූ ලෙන් විහාර ගෘහය තුළය. එහි උස සෙ.මී. 43.5 කි. මෙම ප්‍රතිමාව පිහිටුවා ඇත්තේ සෙ.මී. 24.5 ක් උසැති අත්‍යාලංකාර ලෝහමය ආසනයක් මතය. ආසනයට ආසන්නව සියුම් කැටයමින් සරසන ලද මකර තොරණක් දකගත හැකිය. ධ්‍යාන මුද්‍රාව සහිත වූ මෙම ප්‍රතිමාවෙන් දක්ෂිණ ඉන්දීය ප්‍රතිමා කලා සම්ප්‍රදාය ප්‍රකට කරයි. මෙම ප්‍රතිමාව මලියදේව හිමි විසින් ඉන්දියාවෙන් ගෙන ආ සිව් ප්‍රතිමාවන්ගෙන් එක් ප්‍රතිමාවක් ලෙස ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙම විහාරස්ථානය ආශ්‍රිතව ඇති ඓතිහාසික පසුබිම හා සම්බන්ධ වටිනාකම් පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණු කර ගනිමින් මෙම ගවේෂණය සිදු කළ අතර ඒ සඳහා අදාළ තොරතුරු ලබාගැනීම ප්‍රධාන වශයෙන්ම ලිඛිත මූලාශ්‍ර ඔස්සේ සිදුවිය. මීට අමතරව ක්ෂේත්‍ර ගවේෂණය ඔස්සේ ද දත්ත රැස්කිරීම සිදුවිය. මෙම දත්ත ඔස්සේ තත් ක්ෂේත්‍රයේ ඓතිහාසික ව වැදගත් වන සන්දර්භය පිළිබඳව දනුම ප්‍රවර්ධනය කිරීම අපේක්ෂිතය.

ප්‍රමුඛ පදඃ මාදන්වල, රජමහා විහාරය, ඓතිහාසික, ප්‍රතිමාව, මූලාශ්‍ර

* ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය. summyalosi17@gmail.com